**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

------------------------------------------------------------

**1 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 මතය**

---------

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

--------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන් , ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන් ,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ 09 කින් හා දෙපාර්තමේන්තු 02 කින් ලද ප්‍රතිපාදනවලින් පිළිවෙලින් වැය විෂයයන් 14 කින් හා 03 කින් රු.8,872,101 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ලැබුණු ප්‍රතිපාදනවලින් සියයට 75 සිට සියයට 100 දක්වා ඉහළ පරාසයක පැවතුණි. | අමාත්‍යාංශ 09 කින් සහ දෙපාර්තමේන්තු 02 කින් ප්‍රතිපාදන අහෝසි වීම, සැලසුම් කල වැඩසටහන් අවලංගු වීම, වැඩසටහන් පැවැත්වීමට හා කොරෝනා ව්‍යසනය නිසා මහජනතාව ඒකරාශී කිරීමට නොහැකි වීම බලපා ඇත. | (i) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් ලබාදෙන ප්‍රතිපාදනයන් කල්වේලා ඇතිව ලබාගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කළයුතු වීම.<br>(ii) ලැබෙන ප්‍රතිපාදනයන් හැකිතාක් දුරට උපයෝජනය කර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම. |
| (ආ) අමාත්‍යාංශ 10 කින් හා දෙපාර්තමේන්තු 04 කින් ලද ප්‍රතිපාදනවලින් පිළිවෙලින් වැය විෂයයන් 21 කින් හා 05 කින් එකතුව රු.6,685,970 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. එය ලැබුණු ප්‍රතිපාදනවලින් සියයට 50 සිට 75 දක්වා පරාසයක පැවතුණි. | -එම- | -එම- |
| (ඇ) 2020 වර්ෂයේදී අමාත්‍යාංශ 08 ක් දෙපාර්තමේන්තු 03ක් හා කොමිෂන් සභා 01 ක ප්‍රතිපාදන ඉක්මවා වැය විෂයයන් 24 ක් සඳහා රු.4,559,787 ක වියදම් දරා තිබුණු අතර, එය සියයට 100 සිට සියයට 157 ක පරාසයක පැවතුණි. | ප්‍රතිපාදන අදාල අමාත්‍යාංශ වලින් සහ දෙපාර්තමේන්තු වලින් අප වෙත ලබා දීම ප්‍රමාද වී ඇති බැවින් මෙම ගෙවීම් සිදුකර වැඩිපුර දරා ඇති වියදම් නිරවුල් කර ඇති අතර මේවා අත්‍යාවශ්‍ය වියදම් බව. | අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වලින් ලබාදුන් ප්‍රතිපාදන ඉක්මවා වැය නොකළ යුතු බව. |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමු | අනුකූල නොවීම | | |
| (අ) ගැසට් නිවේදන | | | |
| 2009 මැයි 06 අංක 1600/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයේ ඉඩමක වූ කළුගලක් බදු දී තිබුණද, 2015 සිට කළුගල් කියුබ් 8,087 ක් සඳහා ගාස්තුව අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් රු.65,000 ක මුදලක් 2021 මැයි 06 දින අයකර ගෙන ඇති අතර , තොරතුරු ලදපසු 2020 වර්ෂයට අදාල මුළු ශිඟ බදු මුදල අයකරන බව. | ගැසට් නිවේදනය පරිදි බදුදීමේදි, ගාස්තු අයකළ යුතු වීම. |
| **(ආ)** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| 2002 ජුනි 19 දිනැති අංක 2002/01 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය | එකම සේවා ස්ථානයේ වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරු කළ යුතු වුවද,එකම සේවා ස්ථානයේ වසර 05 -19 අතර කාලයක් සේවයේ යෙදිසිටින නිළධාරීන් **3,132** දෙනෙකුට වාර්ෂිකව ස්ථාන මාරු ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරුවීම් අයදුම් කර ඇති නිළධාරීන්ට සිය අභිමතය පරිදි වසර 05 කට වැඩි නිළධාරීන් හට ස්ථාන මාරුවීම් ලබා දී ඇති බවත්**,** සෙසු නිළධාරීන්ට ඉදිරියේ දී ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කරන බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන වල නියමයන්ට අනුව නිලධාරීන් ස්ථාන මාරුකිරීම් සිදුකළ යුතු වීම. |
| (ඇ) 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛය | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020 වර්ෂයේ සපිරිගමක් ප්‍රජාපාදක ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්ෂේත්‍ර 05 කට අදාල ව්‍යාපෘති 147 ක් හඳුනාගෙන තිබුණද, වර්ෂයේ වියදම් කළ මුදල වූ රු.103,414,716 ක මුදලින් රු.97,308,263 වියදමක් එනම් සියයට 94 ක් මාර්ග ඉදිකිරීම සඳහා පමණක් යොදවා තිබුණි. | ව්‍යාපෘති හඳුනාගැනීමේ දී සංවර්ධනය කළයුතු ක්ෂේත්‍ර 09 ක් දක්වා තිබුණ ද ග්‍රාමීය කමිටු එකඟතාවය මත කොට්ඨාශයේ පවතින ප්‍රමුඛතා අනුව ව්‍යාපෘති තෝරාගෙන ඇත. | ක්ෂේත්‍ර 09 ම ප්‍රමාණවත් ලෙස ආවරණය වන පරිදි ව්‍යාපෘති තෝරාගැනීම සඳහා කටයුතු කළ යුතු බව. |

2.3 **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | --------------------------- |
| (අ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදුන් ප්‍රතිපාදනයන් මත ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 611.13 ක් වන මාර්ග සංවර්ධන ව්‍යාපෘති 09 ක් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෘජු කම්කරු පදනම මත ඉටුකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>(i) තරඟකාරී ප්‍රසම්පාදනයන්ගෙන් බැහැරව සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකර ගැනීම සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණි.<br><br>(ii) සෘජු කම්කරු පදනම මත මෙම ව්‍යාපෘති ඉටුකිරීම සඳහා අවශ්‍ය කම්කරුවන්, යන්ත්‍රෝපකරණ ඇතුළු පහසුකම් වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ නොතිබුණු වාතාවරණය තුළ මෙම ව්‍යාපෘති එම ආයතනය වෙත ලබාදී තිබුණි.<br><br>(iii) මෙම මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා යන්ත්‍ර සපයා ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය, විනිවිදභාවයකින් සිදුකර නොතිබීම, තරඟකාරීත්වය සීමා කර තිබීම සහ මිලදී ගැනීම් සඳහා විධිමත් අධිකාරී බලතල ලැබී නොතිබීම ඇතුළු රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් හා වයඹ පළාත් මූල්‍ය රෙගුලාසි 419 න් බැහැරව කටයුතු කර තිබුණි.<br><br>(iv) ව්‍යාපෘතින් සඳහා ප්‍රධානම අමුද්‍රව්‍ය වර්ග 04 ක් මිලදී ගැනීමේදී සාමාන්‍ය වෙළෙඳපොල මිල ගණන්වලට වඩා ඉතාමත් ඉහළ මිල ගණන්වලට මිලදී ගැනීම් කර තිබීම හේතුවෙන් රජයට රුපියල් මිලියන | (i) රජයට සිදුවී ඇති පාඩුව වගකිව යුතු නිළධාරීන්ගෙන් ආපසු අයකර ගත යුතු වීම.<br>(ii) රජයට උපරිම ආර්ථික වාසිදායක තත්වයක් ලබා ගතහැකි පරිදිත්, ප්‍රසම්පාදන නීති රීති වලට අනුවත් ප්‍රසම්පාදන ක්‍රමවේදන් යොදාගත යුතු වීම. | වයඹ පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් පිළිතුරු ලබා නොදීම හේතුවෙන් මෙම ඡේදයට පිළිතුරු ලබා දීමට මෙම අවස්ථාවේ දි අපහසු බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | 153.75 කට ආසන්න පාඩුවක් සිදුකර තිබුණි. | | |
| (ආ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අයත් වැව් එකොළහක් ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ක්‍රීට් දැමීම, වැකන්ද මතුපිට පස් ඉවත් කිරීම වැකන්දට පස් දැමීම රොන්මඩ ඉවත් කිරීම, ගැටි කාණු කැපීම, තණකොල පිඩැලි ඇල්ලීම යන කාර්යයන් ඉටුකිරීමේදී කාර්මික නිලධාරී සහ අනෙකුත් වගකිව යුතු නිලධාරීන් විධිමත් පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් රු.6,928,609 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අධි ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර බලා,මුදල් රෙගුලාසි 156(1) හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩු මත රු.2,438,195 ක මුදලක් අය කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.<br>ඇස්තමේන්තු කිරීමේ දි රේට් පොතේ දී තිබූ මිල රේට නිවැරදි යැයි සලකා යොදාගෙන ඇති අතර ,ඒ අනුව 2018 යොදා ගත් රේට සාවද්‍ය යැයි සලකා නොමැති අතර ඒවා නිවැරදි රේට ලෙස සැලකිල්ලට ගෙන ඇත. |
| (ඇ) | කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයට අයත් රජයේ ඉඩමක වසර දහයකට ආසන්න කාලයක් අනවසරයෙන් කළුගල් කැඩීමක් සිදුකර තිබුණද,ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් වී නොතිබුණි. මේ හේතුවෙන් වසර 10 ක් තුළ ඒ සඳහා රජයට ලැබීමට තිබූ රාජ්‍ය භාගය අහිමි වී ඇති බව නිරික්ෂණය විය. | (i) රජයට ලැබිය යුතු මුදල් ආපසු අයකරගත යුතු වීම හා අනවසර කළුගල් කැඩීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බව.<br>(ii) රජයේ ඉඩම් වල අනවසර කළුගල් කැඩීම ඇතුළු ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කළයුතු වීම. | අනවසර කළුගල් කැඩීම නතර කරන ලෙස දන්වා ඇති අතර, මේ සම්බන්ධයෙන් භූ විද්‍යා පතල් කාර්යංශය දැනුවත් කර ඇති බව. |
| (ඈ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ පොල්පිතිගම, අමුණුකොලේ බෝගහමුල වැව ගැඹුරු කිරිමේ ව්‍යාපෘතිය භාර ආර්ථික සංවර්ධන නිළධාරිගේ සටහන් අනුව ට්‍රැක්ටර් ලෝඩ් 4786 ක් හෙවත් කියුබ් 3382 ක් වෙන්දේසිය සඳහා ගොඩගසා තිබුණද, කාර්මික නිලධාරි විසින් එය කියුබ් 1670ක් ලෙස දක්වා එකක් රු.600 බැගින් වෙන්දෙසි කිරිමෙන් රු. 1,027,200 ක මුදලක් අහිමි වි ගොස් ඇත. එසේම වෙන්දේසියේ සිටි අනෙකුත් නිලධාරින්ට මෙම ක්‍රියාව වළක්වා ගැනීමට හැකියාව තිබුණ ද එය නොසලකා හැර තිබුණි. | (i) රජයට සිදු වූ පාඩුව වගකිව යුතු නිළධාරීන්ගෙන් අය කරගත යුතු වීම.<br>(ii) අදාල නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | විගණනය විසින් ඉදිරිපත් කර ඇති කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමටත්,පෙන්වා ඇති වැඩිපුර ගෙවීම් අය කිරීමටත් කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම්ට දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ පොල්පිතිගම පාළුබලගොල්ල වැව ප්‍රතිසංස්කරණය සඳහා කාර්මික නිලධාරි විසින් 2018 වර්ෂයේ ඉදිරිපත් කළ මැනුම් පත්‍රයේ ඉටුකළ බව දක්වා ඇති කාර්යන්ට අතිරේකව, 2019 වර්ෂයේ ඉදිරිපත් කළ මැනුම් පත්‍රයේ වැව ශුද්ධ කිරීම, වැකන්ද මතුපිට සනමීටර් 220 ක පස ඉවත් කිරීම, සනමීටර් 12 ක ගැටිකාණු කැපීම, සනමීටර් 96 ක් කැපූ පස් ට්‍රැක්ටරයෙන් ප්‍රවාහනය කර වැකන්දෙ අතුරා තැලීම, රොන් මඩ සනමීටර් 1170 ක් කපා ගොඩ ගැසීම සහ නාම පුවරුව සකස් කිරිම සඳහා රු.1,301,682 ක් ගෙවීම් කර තිබුණි.එසේ වුවද,සත්‍ය ලෙස ඉටු කළේ වැව් බිම ශුද්ධ කිරීම , රෝලෙන් හා තාප්ප රෝලෙන් තැලීම, නාම පුවරුව සවිකිරිම වශයෙන් එකතුව රු. 33,000 ක ප්‍රමාණයක් බව වැඩ බිම් අධීක්ෂණය කළ ආර්ථික සංවර්ධන නිලධාරිනියගේ සටහන් මඟින් තහවුරු වේ. ඒ අනුව රු. 1,268,682 ක් සහතික කර වැඩිපුර ගෙවා ඇතිබව නිරික්ෂණය විය. | අධි ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර බලා,මුදල් රෙගුලාසි 156(1) හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | රු.1,268,682 ක වැඩිපුර ගෙවන ලද මුදල 2021 මාර්තු 31 දිනට පෙර අය කර ගැනීමට හා නොසැලකිලිමත් ලෙස කටයුතු කරන ලද කාර්මික නිළධාරීයාට අවවාද කරන ලෙස පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. |
| (ඊ) | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදී සාවද්‍ය මිල අනුපාතය භාවිත කර ඇස්තමේන්තු සකස් කර තිබුණි. මෙම මිල අනුපාතයන් දෝෂ සහගත බව කාර්මික නිලධාරින් විසින් බිල්පත් සඳහා ගෙවීම් කරනු ලබන අවස්ථාවේදී හඳුනාගෙන තිබුණද, එය නිවැරදි කිරීමට කටයුතු නොකර වැව් 05 ක් සඳහා රු.5,198,933 ක් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | කාර්මික නිළධාරීගේ නොසැලකිල්ල මත සිදු වූ දෙයක් බැවින් අවවාද කරන ලෙසට පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. |
| (උ) | ගම්පෙරළිය සංවර්ධන වැඩසටහන යටතේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැව් දෙකක් ප්‍රතිසංස්කරණය කිරීමේදී නිවැරදි රේටයන් භාවිතා නොකිරීම හේතුවෙන් රු.1,325,869 ක් වැඩිපුර ගෙවා තිබුණි. | -එම- | ඇස්තමේන්තු කිරීමේ දි රේට් පොතේ දී තිබු මිල රේට නිවැරදි යැයි සලකා යොදාගෙන ඇති අතර ,ඒ අනුව 2019 යොදා ගත් රේට සාවද්‍ය යැයි සලකා නොමැති අතර ඒවා නිවැරදි රේට ලෙස සැලකිල්ලට ගෙන ඇත. |
| (ඌ) | සපිරිගමක් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබු ප්‍රතිපාදන වලින් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් වයඹ පළාත් මාර්ග සංවර්ධන | (i) සත්‍ය කළවැඩ ප්‍රමාණයට හා සත්‍ය මිල අනුපාතයන්ට අනුව ගෙවීම් කළයුතු වීම. | මීට අදාළ පිළිතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබී නොමැත. |

| | |
|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර තිබුණි.මෙම ව්‍යාපෘති වලින් ඇස්තමේන්තු වටිනාකම රුපියල් මිලියන දෙකක් වන නාගොල්ලාගම වතුයාය පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>(i) 2012 ජනවාරි 05 දිනැති අංක 1/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව සමිති බල සීමාවෙන් පිටත පිහිටි හා ප්‍රමාණවත් මූල්‍ය හා අනෙකුත් පහසුකම් නොමැති ගොවි සංවිධානයකට මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම.<br>(ii) එසේම එකී චක්‍රලේඛයේ විධිවිධාන වලින් බැහැරව ගොවි සංවිධානය විසින් සියයට 05 ක කොමිස් මුදලකට ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීම, හා අධීක්ෂණය කිරීම හා මැනුම් පත් සකස් කිරීම කළ කාර්මික නිළධාරිට උපකොන්ත්‍රාත්තුවක් ලෙස ලබාදී තිබීම.<br>(iii) ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පතට අනුව ව්‍යාපෘතියට අවශ්‍ය පස්,බොරළු,ABC ඇතුළු අමුද්‍රව්‍ය ප්‍රවාහන වියදම සාවද්‍ය ලෙස දක්වා රු.298,893 ක් වැඩිපුර ගෙවීම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර තිබීම. | (ii) ප්‍රජාපාදක සංවිධාන වෙත ප්‍රසම්පාදන පිරිනැමීමේදි අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම.<br><br>(iii) ව්‍යාපෘති ඇස්තමේන්තු නිවැරදිව සකස් කළයුතු වීම.<br>(iv) මේ සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළයුතු වීම. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් 5 දෙනෙකුට අදාලව රු.538,519 ක ශේෂයන් 2020 දෙසැම්බර් 31 දිනය වන විටත් අයකරගෙන නොතිබුණි. ඒ අතරින් නිලධාරීන් තිදෙනෙකුට අදාල රු.410,436 ක මුදලක් වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ පැවත එන ණය ශේෂයන් බවත්, එයින් රු.302,994 ක | සේවය හැරගිය නිළධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.538,519 ක් බවත්, ඒ අතරින් නිළධාරීන් තිදෙනෙකුගේ ණය ශේෂය වසර 5 කට වඩා වැඩි බවත් එම ණය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | අය නොවී පවතින ණය ශේෂ අයකර ගැනීම සඳහා ගත යුතු පියවරයන් කාර්යක්ෂමව ගත යුතු බව. |

ශේෂයක් වසර 10 කට වඩා වැඩි ශේෂයන් විය.

## 2.5 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ උඩුබද්දාව, නාරම්මල, පොල්පිතිගම හා රස්නායකපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ වූ කොන්ත්‍රාත් සඳහා රඳවුම් මුදල් රු.3,682,069 ක් වර්ෂ 2-5 අතර කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණ අතර, මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කීපයක වසර 2-5 අතර පවතින රඳවුම් මුදල් වල අඩුපාඩු නිවැරදි කර කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සපිරි ගමක් වැඩසටහන යටතේ රු.4,000,000 ක වටිනා මාර්ග දෙකක් තාර දමා සංවර්ධනය කිරීමේදී ABC ගොනු කිරීමක් සිදු නොකර ටිපර් රථ මගින් කෙලින්ම මාර්ගයට දමා තිබුණි. මෙම මාර්ග දෙක සඳහා ඝන මීටර් 245 ක් ස්ථාන 128 ක දමා තිබීම ගොනු කිරීමක් ලෙස විගණනයට පිළිගත නොහැකි විය.<br>මෙම මාර්ග දෙකෙන් එක් මාර්ගයක් ABC අතුරා පමණක් තිබූ අතර, ABC මි.මී.225 ක් ඝනත්වයට ඇතිරිය යුතු වුවද, ස්ථාන 05 ක භෞතික පරීක්ෂාවේදී අතුරා තිබූ ABC වල ඝනත්වය මි.මී.150 ට ආසන්නව පැවතුණි. දෙවනි මාර්ගයේ ABC දමා ඝනත්වයට තලා තිබූ අතර, එහි මි.මී.150 ක් තිබිය යුතු වුවද, ස්ථාන 06 ක භෞතික පරීක්ෂාවේදී ඝනත්වය මි.මී.120 ක්ව පැවතුණි. | වාරියපොල ප්‍රාදේශීය ලේකම් විසින් වාරියපොල ප්‍රාදේශීය සභාවේ සහකාර ලේකම් වෙත 2021 පෙබරවාරි 02 දින දන්වා ඇතත් පිළිතුරු ලැබී නොමැත. ඉදිරියේදි පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරන බව. | (i) ව්‍යාපෘති අධීක්ෂණයට අදාල ආර්ථික සංවර්ධන නිළධාරීගේ කාර්යභාරය නිවැරදිව ,කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පවතින අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කළයුතු බව.<br>(ii) ඇස්තමේන්තු ප්‍රකාරව ගුණාත්මකභාවයකින් යුක්තව ව්‍යාපෘති ඉටු කළයුතු බව.<br>(iii) නිවැරදි මිණුම් ගෙන ගෙවීම් කළයුතු බව. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.10,000,000 ක මුදලක් වැය කරමින් නිමකළ යුතු බව දක්වා තිබූ කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වඩුගෙදර ජල ව්‍යාපෘතියේ වගා ළිදක් හා ජල ටැංකියක් ඉදිකර තිබුණද, එම ළිඳ ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | දැනට මෙම ළිඳෙන් ජලය පාවිච්චියට ගැනීමට ක්‍රමයක් නොමැති බැවින් ළිඳ අපිරිසිදු වී ඇති නමුදු බීමට ජලය සපයා ගැනීම සඳහා ඉදිකරුණු ලැබූ ළිදක් එම ළිඳ ආශ්‍රය කර ගනිමින් ජල ව්‍යාපෘතිය සැලැසුම් කරන බව. | ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ඉටු කළයුතු වීම. |

### 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ පොල්පිතිගම මිල්ලගොඩ කඳුරු ඇල පාලම හරහා අමුණක් ඉදිකිරීම සඳහා රු.1,975,515 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණද, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකර අතහැර දමා තිබුණි. | ධාරානිපාත වර්ෂාව හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව. | ව්‍යාපෘති කල්වේලා ඇතිව ඉටුකිරීම සඳහා සැලසුම් කළයුතු බව. |
| (ආ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය කමිටුව මඟින් නිර්දේශ කළ රු.1,500,000 ක් වටිනා ව්‍යාපෘති 02 ක් ක්‍රියාවට නංවා නොතිබුණි. | ග්‍රාමීය කමිටු නිර්දේශ කලත් ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව නාගරික කොමසාරිස් දන්වා ඇත. | -එම- |

### 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ රජයට ඉඩම් කට්ටි 2,473 ක් අත්පත් කර ගැනීමේදී අවු.02 සිට 18 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | රජයට ඉඩම් අත්පත් කර ගැනීමේදී එම ක්‍රියාවලිය ආයතන ගණනාවකින් සම්බන්ධීකරණය වන බැවින් සමස්ථ අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් සිදු විය. | ඉඩම් අත්පත් කර ගැනීමේදී විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය හැකිතාක් කඩිනම් කර ගැනීම. |

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්වරිය 2020 සැප්තැම්බර් 18 දින විශ්‍රාම ගියද, ඇය වෙත ලබා දී තිබූ S/NO-SW-5-012-147X අංක දරන ටැබ්ලට් පරිගණකය ආපසු භාර දී නොතිබුණි. | මේ සඳහා පරීක්ෂණයක් සිදු කිරීමට නියමිත බව. | (i) නිලධාරීන් විශ්‍රාම ගැනිමේ දී ඉන්වෙන්ට්‍රි භාණ්ඩ විධිමත්ව, නිවැරදිව භාරගැනීම සඳහා පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කළයුතු බව.<br><br>(ii) ඉන්වෙන්ට්‍රි භාණ්ඩ නිවැරදිව භාරනොගෙන නිළධාරීනිය විශ්‍රාම යාමට කටයුතු කිරිම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) | දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රාදේශීය ලේකම්, නිල නිවසෙහි පදිංචි වී නොසිටිම හේතුවෙන් මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල නිවස නිශ්කාර්යව දිරාපත්වෙමින් පැවතුණි | නිලනිවාසය පදිංචිය සඳහා සුදුසු තත්වයේ නොතිබුණ හෙයින් අළුත්වැඩියා හා ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබාදී ඇති බව. | නිලනිවාසයේ පදිංචි වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බව. |
| (ඇ) | මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වර්ග 24 කට අයත් භාණ්ඩ අයිතම 74 ක් පමණ, භාණ්ඩ සමීක්ෂණයටද ලක් නොවී අංක 01 පැරණි ගබඩාව, නිල නිවසේ ගරාජය හා නිල නිවස පිටුපස හා නිල නිවසෙහි වර්ෂ 15 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | භාවිතයට ගතහැකි භාණ්ඩ නිළධාරීන් හට ලබාදුන් අතර භාවිතයට ගතනොහැකි භාණ්ඩ 2020 භාණ්ඩ සමීක්ෂණයෙන් පසු වෙන්දේසි කිරීමට නියමිත බව. | නිශ්කාර්යව පවතින භාණ්ඩ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතු බව. |
| (ඈ) | මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩානගම දිවා රාත්‍රී වොලිබෝල් ක්‍රීඩා පිටිය, උඩානගම පෙර පාසැල් ගොඩනැගිල්ල, උඩානගම ප්‍රජා ශාලාව හා කාර්යාල පරිශ්‍රයේ පවතින දිග අඩි 26 ක් හා පළල අඩි 14 ක් පමණ වන ගොඩනැගිල්ල නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණි. | මේ පිළිබඳව වාර්තාවක් කාර්මික නිළධාරීන්ගෙන් ලබා ගෙන ඉදිරි කටයුතු සූදානම් කරන බව. | නිශ්කාර්යව දිරාපත් වෙමින් පවතින ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

## 3.6 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ක්‍රීට් කැටගල් යොදා මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ විෂය සඳහා (RS1-017) මාර්ග සම්මත අනුපාතය දෝෂ සහගත ලෙස සකස් කර තිබීම හේතුවෙන් ගම්පෙරළිය වැඩසටහන යටතේ ප්‍රජාපාදක සංවිධාන මඟින් ඉටුකරන ලද ව්‍යාපෘති 100 කින් රු.5,508,631 ක පාඩුවක් රජයට සිදුවී තිබුණි. | වයඹ පළාත් සභාවේ ලේකම් විසින් පිළිතුරු ලබා නොදීම නිසා මෙම ඡේදයට පිළිතුරු ලබා දීමට මේ අවස්ථාවේ අපහසු බව. | රජයට සිදු වී ඇති පාඩුව ආපසු අය කර ගත යුතු බව. |

## 3.7 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බහු කාර්යය සංවර්ධන කාර්ය සහායක තනතුර සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා තෝරාගත් අයදුම්කරුවන් 73 දෙනා අතරින් ලබා ගතයුතු අවම ළකුණු මට්ටමට වඩා අඩු ලකුණු මට්ටම ඇතුළත් අයදුම්කරුවන් 49 දෙනෙකු සේවයට බඳවාගෙන තිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛ උපදෙස් පරිදි අදාල අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සහ ග්‍රාම නිලධාරී කාර්යාල වෙතින් නිකුත් කිරීමේදි වයස් සීමාව 18-45 අතර පැවතිය යුතු බවට ප්‍රමාණවත් දැනුවත් කිරීමක් සිදු වූ බව. | බඳවා ගැනීමේදි චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළයුතු බව. |
| (ආ) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුර සඳහා සුදුස්සන් තෝරාගැනීමේදී 2020 ජනවාරි 20 දින දරන පුවත්පත් දැන්වීමෙන් බැහැරව වයස අවුරුදු 40 ට වැඩි අයදුම්කරුවන් 10 දෙනෙකු බඳවාගෙන තිබුණි. | පුවත්පත් දැන්වීම සහ චක්‍රලේඛ නිකුත් කර ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් වන අතර මා වෙත චක්‍රලේඛ ප්‍රකාරව පැවරුනු බලතල අනුව ඉදිරි කටයුතු සිදු කර ඇති බව. | සුදුස්සන් බඳවා ගැනීමේ ක්‍රමවේදයේදි ගැටළුකාරී තත්ත්වයක් ඇති නොවන ආකාරයට බඳවා ගැනීම් කලයුතු බව. |
| (ඇ) මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පවතින දෝෂය වර්ෂයකට වැඩි කාලයක් ගතවී ඇතත් නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව ඇඟිලි සලකුණු යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු සිදු කර ඇති බව. | ඇඟිලි සලකුණු යන්ත්‍රයේ දෝෂ තත්ත්වයන් පැනනැගීමේදි ඒ සඳහා කඩිනමින් පියවර ගත යුතු බව. |
| (ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දෙන ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හැකිතාක් | කාර්මික නිළධාරීන්ගේ සේවය උපරිම උපයෝජනයක් වන අයුරින් සංවර්ධන ව්‍යාපෘති | ව්‍යාපෘතිය සැලසුම් සහගතව තෝරාගත යුතු අතර, ඒවා ක්‍රියාත්මක |

| | | | |
|---|---|---|---|
| | දුරට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉටු කළ යුතු වුවද, සපිරිගමක් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබූ ව්‍යාපෘති 194 න් ව්‍යාපෘති 02 ක් පමණක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිළධාරීගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කර තිබුණි. මේ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීන් දෙදෙනාගෙන් සංවර්ධන ව්‍යාපෘතිවලට සෘජු දායකත්වයක් නොලැබෙන අතර ව්‍යාපෘති කලින් සැලසුම් කළ කාල රාමුව තුළ නිම නොවීමක්ද දක්නට ලැබුණි. | සඳහා යොදවා ගන්නා ලෙසට මාවතගම ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබාදී ඇති බව. | කිරීමේදි විධිමත් ක්‍රම වේදයකට ලබා දිය යුතු බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු කාර්මික නිළධාරීන්ගෙන් අධීක්ෂණය සහිතව හැකිතාක් දුරට සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළයුතු බව. |
| (ඉ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම ශක්ති පළමු අදියර යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ග්‍රාම නිලධාරී වසම් 03 ක් සඳහා රු.3,579,825 ක මුදලක් වෙන්කර තිබුණු අතර, එයින් ප්‍රතිලාභීන් 59 දෙනෙකු සඳහා රු.825,000 ක ණය මුදල් ලබා දී ඉතිරි රු.2,754,825 ක මුදල කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගෙන පැවතුණි. | ස්වයං රැකියා ආරම්භ කිරීමට සුදුසු වාතාවරණයක් රට තුල නොතිබීම හේතුවෙන් ප්‍රතිලාභීන් ණය මුදල් ලබා ගැනීමට එකඟතාවයක් නොදැක්වීම සහ ප්‍රතිලාභීන් වෙනත් ආයතන වෙතින් ණය ලබා ගැනීම හේතුවෙන් 59 දෙනෙකුට පමණක් ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීමට සිදුවී ඇත. | ග්‍රාම ශක්ති වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද මුදල් නිසි පරිදි ප්‍රතිලාභීන් සඳහා ලබා දිය යුතු බව. |
| (ඊ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමිකයින් 43 දෙනෙකුට වැඩිපුර ගෙවූ මුදලින් රු.2,912,372 ක මුදලක් තව දුරටත් අයකර ගත යුතුව තිබුණි. | තවදුරටත් අයවීමට ඇති රු.2,912,372 ක මුදල දත්ත පද්ධතිය මගින් අදාල විශ්‍රාමිකයින්ගේ වැටුපෙන් අයවෙමින් පවතින බව දන්වා ඇත. | විශ්‍රාමිකයින් සඳහා වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගත යුතු වීම. |
| (උ) | පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කලවාන වැව ප්‍රතිසංස්කරණය කළ උපකොන්ත්‍රාත් කරුගේ ලාභය වැඩි කිරීම සඳහා රොන්මඩ බහුලව තැම්පත් වී ඇති ප්‍රදේශයට බැහැරින් පාරට ආසන්න දකුණු කෙළවරේ වාන ආශ්‍රිත පස අනවසරයෙන් බැකෝ යන්ත්‍ර යොදවා ඉවත් කිරීමට නිළධාරි අවසර දී ඇති බව නිරීක්ෂණය විය. | මින් ඉදිරියට සුළුවාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වලදි රොන්මඩ ඉවත් කිරීමේ දි වැවේ රොන්මඩ ස්ථරයේ ඝනකම හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයකින් පසු ක්‍රියාත්මක කිරීම සඳහා සියළු නිළධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කරමි. | වැව් ප්‍රතිසංස්කරණය කිරීමේදි වැවට හානි නොවන ආකාරයට රොන්මඩ ඉවත් කලයුතු බව. |

| | | |
|---|---|---|
| මෙම හේතුවෙන් වැකන්දට ඉතා ආසන්නව මීටරයකට වැඩි ගැඹුරකින් හැරීමෙන් වැකන්දට හානි සිදු වී තිබුණි. | | |

**3.8 අමාත්‍ය මණ්ඩල තීරණවලින් බැහැරවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 මැයි 14 දින අංක. 20/0796/212/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් බැහැරව කොවිඩ් 19 හේතුවෙන් ජන ජීවිතය පවත්වාගෙන යාමට අපහසු පවුල් සඳහා රු.5,000 ක ප්‍රතිලාභ මුදල ගෙවීමේදී දැනටමත් සමෘද්ධි සහනාධාරය ලෙස මාසිකව ලබාදෙන සහනාධාර මුදල් සහ රු.5,000 යන දෙකෙහි වෙනස පමණක් ලබාදිය යුතු වුවද, සමෘද්ධි සහනාධාර මුදල සහ රු.5,000 දීමනාව යන දෙකම ගෙවා තිබුණි. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 30 යටතේ ඇති නිත්‍ය සමෘද්ධි ප්‍රතිලාභීන් 173,316 ක් සඳහා රු.424,346,960 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | 2020 මැයි 14 දින අංක 20/0796/212/015-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ඇතුළත් උපදෙස් දිස්ත්‍රික් ලේකම් වෙත ලැබී නොමැත. සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ අනුව අප්‍රේල් මාසය සඳහා සහන ණය මැයි මාසය සඳහා සමාජ ප්‍රතිලාභ ලෙස ගෙවීම් කර ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව ගෙවීම් කලයුතු වීම. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ දී, වැඩසටහන් 22 ක් සඳහා රුපියල් මිලියන 67.3 ක මුදලක් වෙන්කර තිබුණද, ප්‍රගතියක් දක්නට නොලැබුන අතර, 2020 වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වූ වැඩසටහන් 12 ක් 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ප්‍රතිපාදන ලැබෙන විට රටේ උද්ගතව පැවති කොරෝනා ව්‍යසන තත්ත්වය හේතුවෙන් ජනතාව/ සේවාලාභීන් ඒකරාශි කල නොහැකි විය. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව හැකිතාක් දුරට ක්‍රියාත්මක කලයුතු බව. |
| (ආ) 2020 වර්ෂයට අදාලව ප්‍රගතිය සලකා බැලීමේදී වැඩසටහන් 16 ක් සම්බන්ධයෙන් මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 50 ට අඩු ප්‍රතිශතයක් පෙන්නුම් කර තිබුණ අතර, 2020 වර්ෂයේ තිරසර සංවර්ධන අරමුණු යටතේ ඇතුළත් නොවූ එකතුව රුපියල් මිලියන 23.4 ක වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කර තිබුණි. | විශේෂ අවශ්‍යතා මත නව වැඩසටහන් 08 ක් ක්‍රියාත්මක කිරීමට සිදු විය. | -එම- |

## 5 යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙබ් අඩවි මහජන පැමිණිලි භාරගත හැකි ආකාරයෙන් සකස් කර නොතිබුණි. | මෙම වෙබ් අඩවියේ කටයුතු ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉටු කරන අතර දෝෂ සම්බන්ධව අමාත්‍යාංශයේ නිළධාරීන් වෙත දන්වා ඇත. | වෙබ් අඩවි, මහජන පැමිණිලි බාරගත හැකි ආකාරයට සකස් කල යුතු බව. |
| (ආ) පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඍජු ක්‍රමයට ප්‍රදානය කළ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති වලට අදාල කොන්ත්‍රාත් විවිධ බලපෑම් මත හෝ නොමැතිව උපකොන්ත්‍රාත් කරුවන් ලවා ඉටුකර තිබුණි. එහිදි වියදම් කර ඇති මුදලට ප්‍රමාණවත් කාර්යක් ඉටුකර නොතිබුණි.මේ සම්බන්ධයෙන් රජයේ කාර්යයන්හි අවිධිමත් ස්වරූපය පිළිබඳ අප්‍රසාදයන් ප්‍රදේශ වාසින්ගෙන් ඉදිරිපත් වි තිබුණි. | ව්‍යාපෘති කරගෙන යාමේදි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා උපකොන්ත්‍රාත් ලබා දීමට සිදු වූ බව. | (i) මහජනතාවට හැකිතාක් දුරට ප්‍රයෝජනවත් වන පරිදි ලැබෙන ප්‍රතිපාදනයන් ව්‍යාපෘතීන් සඳහා යොදාගත යුතු බව.<br>(ii) අංක 01/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු බව. |

## 6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයක් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිංහල / ඉංග්‍රීසි භාෂා පරිවර්ථක තනතුරු සඳහා නිලධාරීන් 09 දෙනෙකු ද, ඉංග්‍රීසි/දෙමළ භාෂා පරිවර්ථක තනතුරු සඳහා එක් නිලධාරීයකුද, අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතුණි. | මෙම නිළධාරීන් මෙම කාර්යාල වල අනුමත කාර්යය මණ්ඩලයේ නිළධාරීන් නොවන අතර, ඒ අවස්ථාවන් වලදි අමාත්‍යාංශයේ අනුයුක්ත කිරීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරයි. | අතිරික්ත කාර්ය මණ්ඩලයේ ඌණතාවය පවතින රජයේ ආයතන වලට මාරු කිරීමට කටයුතු කළ යුතු බව. |